දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 24/2014

බ/12/06/සි.සු/2015
ගිණුම් අංශය,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2014.06.30

සියළුම බන්ධනාගාර අධිකාර්වරුන්, සහකාර අධිකාර්වරුන්,වෙත,

<u>සිරකරු සුභසාධක අරමුදල් ගිණුමේ 2015 වර්ෂය සදහා ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම.</u>

ඉහත අරමුදල සම්බන්ධයෙන් සෑම ඉදිරි වර්ෂයක් සදහාම අයවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වෙත හා මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය. එබැවින්, පහත සටහන් වලට අනුව 2015 මුදල් වර්ෂය සදහා අයවැය ඇස්තමේන්තුව සකස් කර බන්ධනාගාර මූලස්ථානය වෙත එවීමට කටයුතු කරන ලෙස දන්වමි.

02. එකී අයවැය ඇස්තමේන්තුවට 2015 වර්ෂය තුලදී සුභසාධක අරමුදලට බැර වශයෙන් බලාපොරොත්තු වන ලැබීම්ද, හර වශයෙන් බලාපොරොත්තු වන ගෙවීම්ද ඇතුලත් කල යුතු අතර අරමුදලේ ලැබීම් වශයෙන් වර්ෂය තුල ලැබීම් වල සත්‍ය තත්වයට ආසන්න වන අයුරින් ලැබීම් ඇස්තමේන්තුව පිළියෙල කල යුතුය. 2015 වර්ෂය සදහා ලැබීම් හා ගෙවීම් ඇස්තමේන්තුව (ආකෘතිය - ඒ) මගින් පිළියෙල කල යුතු අතර 2013 ජූලි සිට 2014 වර්ෂයේ ජූනි දක්වා මාස 12 (දොළහක) ලැබීම් හා ගෙවීම්වල සත්‍ය තත්වය (ආකෘතිය - බී) මගින් පිළියෙල කර එවිය යුතුය.

03. තවද, මෙම ඇස්තමේන්තුව සැකසීමේදී පවතින සත්‍ය වියදමට වඩා විචලනය 20% ඉක්මවයි නම්, මුළු විචලනය සදහා විස්තරාත්මකව වියදම් විස්තර ලබාදිය යුතුය. ඉහත උපදෙස් අනුව සැකසූ 2015 වර්ෂය සදහා වන අයවැය ඇස්තමේන්තුව 2014. ජූලි 20 දින හෝ ඊට පෙර බන්ධනාගාර කොමසාරිස් (සුභ සාධක) වෙත පිටපතක් සහිතව බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත ඉදිරිපත් කරන මෙන් දන්වමි. නියමිත අකෘතීන්ට අනුව සැකසූ අයවැය ඇස්තමේන්තුව 2014. ජූලි 20 දිනට පෙර බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත ලැබීමට සැලැස්විය යුතු බව වැඩි දුරටත් දන්වා සිටිමි.

04. යම් උප බන්ධනාගාර ආයතනයක් 2014. ජූලි 20 දිනට පෙර නිවැරදිව සකස්කල ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත්, එම ආයතනයේ වියදම් සමස්ථ ඇස්තමේන්තුවට ඇතුලත් නොකෙරෙනු ඇත. තවද මෙම ගිණුම් පවත්වාගෙන යායුතු ආකාරය පිළිබද 1977.11.16 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක:56/1977 හා1987.03.20 දිනැති සංශෝධිත දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: 559 මගින්ද උපදෙස් ලබාදී ඇත.

05. 2015 වාර්ෂික වියදම් ඇස්තමේන්තුව සකස් කිරීමේදී වියදම් ශීර්ෂ අංක: 01 සිට 06 දක්වා සදහන් කරනු ලබන ඇස්තමේන්තුගත වියදම්, 2015 වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංයුක්ත සැලසුම් හා ක්‍රියාකාර සැලසුම් වලට අනුකූල විය යුතුය. 2015 ඇස්තමේන්තුවට ඇතුලත් වියදම් හැර අන් කිසිවක් සදහා ප්‍රතිපාදන හෝ අක් මුදල් නිකුත් කරනු නොලැබේ.

.................................................
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.

පිටපත:
01. බන්ධනාගාර කොමසාරිස් (සුභසාධක)
02. නියෝජ්‍ය කොමසාරිස් (අභ්‍යන්තර විගණන)

(ආකෘතිය - ඒ)

# 2015 මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තුව.

## සිරකරු සුභසාධක අරමුදල.

| 2015 මුදල් වර්ෂය තුල අපේක්ෂිත ලැබීම් (ගිණුමට බැර) | | 2015 මුදල් වර්ෂය තුල අපේක්ෂිත ගෙවීම් (ගිණුමට හර) | |
|---|---|---|---|
| ලැබීම් ශීර්ෂය | රු. | ගෙවීම් ශීර්ෂය | රු. |
| 1. විනොද භාණ්ඩ නිශ්පාදන ලාභයෙන් 1/6 කොටස | | 1. සිරකරුවන්ගේ අධ්‍යාත්මික හා ආගමික කටයුතු වියදම් (සියළුම ආගමික උත්සව කටයුතු සඳහා වියදම්, භාවනා වැඩසටහන්, ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් සඳහා වියදම්) | |
| 2. සිර වේතන වලින් කරනු ලබන අනිවාර්යය අයකිරීම් | | 2. සිරකරුවන්ගේ අධ්‍යපන හා සුභසාධක කටයුතු වියදම්. (දැනුම වර්ධනය කර ගැනීම සඳහා දරණ වියදම් හා සුභසාධනය උදෙසා දරන වියදම්) | |
| 3. මහජන පරිත්‍යාග වලින් ලද මුදල් | | 3. සිරකරුවන්ගේ ක්‍රීඩා හා වෙනත් පහසුකම් සඳහා වූ වියදම් (ක්‍රීඩා කුසලතා වර්ධනය හා පුහුණුවීම් සඳහා වියදම් හා වෙනත් පහසුකම් වැඩිදියුණු කිරම සඳහා දහණු ලබන වියදම්.) | |
| 4. සිරකරුවන්ගේ ශ්‍රමය සපයීමෙන් නිසා වෙනත් දෙපාර්තමේන්තු වලින් ලද ආදායම්. | | 4. සිරකරුවන්ට ත්‍යාග ලබාදීම සඳහා වූ වියදම්. (පවත්වනු ලබන තරග අදියෙන් ලබා ගන්නා ජයග්‍රහන උදෙසා ලබා දෙන ත්‍යාග මුදල් හෝ භාණ්ඩ) | |
| 5. සිරකරුවන් වෙත තිබී හසුවූ නිති විරෝධි මුදල් ලැබීම් | | 5. සිරකරුවන්ගේ පශ්චාත් භාර සේවා කටයුතු සඳහා වූ වියදම්.(නිදහස්වූ සිරකැවන් වෙනුවෙන් දරනු ලබන පසුභාර සේවා වියදම්) | |
| 6. බන්ධනාගාර භැම්යේ තිබී සොයාගත් එහෙත් අයිතිකරුවන් නොමැති මුදල් ලැබීම් | | 6. ආපසු ගෙවිය යුතු අත්තිකාරම් මුදල් (ගෙවීම්) (සිරකරුවන්ගේ ශ්‍රමය යොදාගෙන විකුණා ලාභ ලැබිය හැකි යම් නිශ්පාදනයක් කිරීමට අවශ්‍ය මූලික අමුද්‍රව්‍ය වියදම් වෙනුවෙන් අත්තිකාරම් ලෙස ලබාගෙන පසුව පියවිය යුතු වියදම්) | |
| 7. වෙලඳ සැල් වලින් ලද මුදල් ලැබීම් | | | |
| 8. ප්‍රදර්ශණ සඳහා ඉදිරිපත් කල භාණ්ඩ විකිණිම හා අනිකුත් ප්‍රදර්ශණ ලැබීම්. | | | |
| 9. ආපන ශාලා වලින් ලද මුදල් ලැබීම්. | | | |
| 10. වෙනත් දායක මුදල් ලැබීම්. | | | |
| 11. හිමිකම් පානු නොලැබු මුදල් ලැබීම්. | | | |
| 12. ආපසු ගෙවිය යුතු අත්තිකාරම් මුදල් ලැබීම. | | | |
| වර්ෂය තුල අපේක්ශිත මුළු ලැබීම් | | වර්ෂය තුල අපේක්ශිත මුළු ගෙවීම් | |

සකස් කලේ:- ......................................

පරීක්ෂා කලේ:- ....................................

..............................................................

ස. බන්ධනාගාර අධිකාර/ බන්ධනාගාර අධිකාර,

(ආකෘතිය - බී)

# සත්‍ය ලැබීම් හා ගෙවීම්.

(2013.07.01-2014.06.30)

## සිරකරු සුභසාධක අරමුදල.

| 2013/2014 මුදල් වර්ෂය තුල සත්‍ය ලැබීම් (ගිණුමට බැර) | | | 2013/2014 මුදල් වර්ෂය තුල සත්‍ය ගෙවීම් (ගිණුමට හර) | | |
|---|---|---|---|---|---|
| ලැබීම් ශීර්ෂය | 201307.01 සිට 2013.12.31 | 2014.01.01 සිට 2014.06.30 | ගෙවීම් ශීර්ෂය | 2013.07.01 සිට 2013.12.31 | 2014.01.01 සිට 2014.06.30 |
| 1. විනොද භාණ්ඩ නිශ්පාදන ලාභයෙන් 1/6 කොටස | | | 1. සිරකරුවන්ගේ අධ්‍යාත්මික හා ආගමික කටයුතු වියදම් (සියළුම ආගමික උත්සව කටයුතු සදහා වියදම්, භාවනා වැඩසටහන්, ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් සදහා වියදම්) | | |
| 2. සිර වේතන වලින් කරනු ලබන අනිවාර්යය අයකිරීම් | | | 2. සිරකරුවන්ගේ අධ්‍යපන හා සුභසාධක කටයුතු වියදම්. (දැනුම වර්ධනය කර ගැනීම සදහා දරණ වියදම් හා සුභසාධනය උදෙසා දරන වියදම්) | | |
| 3. මහජන පරිත්‍යාග වලින් ලද මුදල් | | | 3. සිරකරුවන්ගේ ක්‍රීඩා හා වෙනත් පහසුකම් සදහා වූ වියදම් (ක්‍රීඩා කුසලතා වර්ධනය හා පුහුණුවීම් සදහා වියදම් හා වෙනත් පහසුකම් වැඩිදියුණු කිරම සදහා දැරණු ලබන වියදම්.) | | |
| 4. සිරකරුවන්ගේ ශ්‍රමය සපයීමෙන් නිසා වෙනත් දෙපාර්තමේන්තු වලින් ලද ආදායම්. | | | 4. සිරකරුවන්ට ත්‍යාග ලබාදීම සදහා වූ වියදම්. (පවත්වනු ලබන තරග අදියෙන් ලබා ගන්නා ජයග්‍රහන උදෙසා ලබා දෙන ත්‍යාග මුදල් හෝ භාණ්ඩ) | | |
| 5. සිරකරුවන් වෙත තිබී හසුවූ නීති විරෝධී මුදල් ලැබීම් | | | 5. සිරකරුවන්ගේ පශ්චාත් භාර සේවා කටයුතු සදහා වූ වියදම්.(නිදහස්වූ සිරකැවන් වෙනුවෙන් දරනු ලබන පසුභාර සේවා වියදම්) | | |
| 6. බන්ධනාගාර භූමියේ තිබී සොයාගත් එහෙත් අයිතිකරුවන් නොමැති මුදල් ලැබීම් | | | 6. ආපසු ගෙවිය යුතු අත්තිකාරම් මුදල් (ගෙවීම්) (සිරකරුවන්ගේ ශ්‍රමය යොදාගෙන විකුණා ලාභ ලැබිය හැකි යම් නිශ්පාදනයක් කිරීමට අවශ්‍ය මූලික අමුද්‍රව්‍ය වියදම් වෙනුවෙන් අත්තිකාරම් ලෙස ලබාගෙන පසුව පියවිය යුතු වියදම්) | | |
| 7. වෙලද සැල් වලින් ලද මුදල් ලැබීම් | | | | | |
| 8. ප්‍රදර්ශණ සදහා ඉදිරිපත් කල භාණ්ඩ විකිණීම හා අනිකුත් ප්‍රදර්ශණ ලැබීම්. | | | | | |
| 9. ආපන ශාලා වලින් ලද මුදල් ලැබීම්. | | | | | |
| 10. වෙනත් දායක මුදල් ලැබීම්. | | | | | |
| 11. හිමිකම් පානු නොලැබූ මුදල් ලැබීම්. | | | | | |
| 12. ආපසු ගෙවිය යුතු අත්තිකාරම් මුදල් ලැබීම. | | | | | |
| වර්ෂය තුල මුළු සත්‍ය ලැබීම් | | | වර්ෂය තුල මුළු සත්‍ය ගෙවීම් | | |

සකස් කළේ:- .......................................

පරීක්ෂා කළේ:- ...................................

.............................................................

ස. බන්ධනාගාර අධිකාර්/ බන්ධනාගාර අධිකාර්,